පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

ආයතනයේ නම - නිවාස ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය,

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நாடாளுமன்ற வெளியீட்டுத் தொடர் எண் – 492

நிறுவனத்தின் பெயர் - வீடமைப்பு, நிர்மாணம் மற்றும் நீர் வழங்கல் அமைச்சு,

கட்டிடத் திணைக்களம், அரச தொழிற்சாலைகள்

திணைக்களம்

நாடாளுமன்றத்தின் பொதுக் கணக்குகள் குழுவால் தாக்கல் செய்யப்பட்ட அறிக்கைகள் மீது, நிலை ஆணை எண் 119(4)-இன் கீழ் மாண்புமிகு அமைச்சர் அவர்களால் எடுக்கப்பட்ட கருத்துக்களையும் நடவடிக்கைகளையும் நாடாளுமன்றத்திற்குச் சமர்ப்பித்தல்.

Parliament Series No 492

Name of the institution – Ministry of Housing Construction and Water Supply,

Department Buildings, Department of Government Factory

Submission of observation of Hon.Minister and steps taken with regard to the reports tabled by the committee on Public Accounts in terms of Standing Order No.119(4).

වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/ වත්මන් තත්ත්වය
ජල සම්පාදන අමාත්‍යාංශය පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: **492** I කොටස 75.00	
2022.12.13 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේ වනවිට අංක 2022/05 දරණ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2022 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අනුමැතිය ලබාගෙන ඇත.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ විගණන විමසුම් සඳහා පිලිතුරු ලබා ගැනීමට ජාතික ජලසම්පාදන මණ්ඩලය වෙත යොමු කර අදාළ පිළිතුරු ලබාගැනීම සඳහා සැලකිය යුතු කාලයක් ගත වීම මීට ප්‍රධාන වශයෙන් හේතු වේ. කෙසේ වුවත්, දී ඇති කාලරාමුව තුළ මෙම කටයුත්ත සිදු කිරීමට සියලුම නිලධාරීන්ට උපදෙස් දී ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	දී ඇති කාලරාමුව තුළ මෙම කාර්යය ඉටු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත.
2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 වන කොටසේ 11.1 වගන්තියෙහි සඳහන් කාලරාමුව තුළ, 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 756 (6) වගන්තිය ප්‍රකාරව නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණය කර ඊට අදාළ වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2024 හා 2025 වර්ෂ වලට අදාලව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	2025 වර්ෂ වලට අදාලව භාණ්ඩ සමීක්ෂණය කර හඳුනාගත් අතිරික්ත, ඌනතා පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග සිදු කිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත. තවද ඉදිරියේදී භාණ්ඩ සමීක්ෂණයන් නියමිත කාල රාමුව තුල ඉටුකිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	මෝටර් රථ දෙපාර්ථමේන්තුව සමඟ සම්බන්ධ වී වාහනවල අයිතිය ජලසම්පාදන අමාත්‍යාංශය වෙත පවරා ගැනීම සඳහා කොම්ට්‍රෝලර් ජනරාල් අනුමැතිය 2024.11.04 දින ලදබා දී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	එම වාහන අතුරින් QR-8915, TY-7814, KB-4085 යන වාහන අමාත්‍යාංශය සතුව පවතින අතර එම වාහන නිවාස ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ නමට ලියාපදිංචි කිරීමට කටයුතු කරමින් පවතී. අනෙකුත් සියලුම වාහන විවිධ රජයේ ආයතන වෙත බාර දී ඇති අතර වාහන පවරා ගැනීමට අවශ්‍ය ලියවිලි නිකුත් කර ඇත. විගණකාධිපතිවරයා වෙත අවශ්‍ය වාර්තා ලබා දීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත.
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි	වර්තමානය වන විට, අමාත්‍යාංශයේ වාහන සංචිතය යටතේ ධාවනය වන සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර අලවා ඇත.
රෙගුලාසිවලට අනුව, රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් නිසි පියවර ගෙන නොතිබුණි.	වාහන අනතුරු කීපයක් සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් වෙත මු. රේ 104(4) යටතේ අලාභය පිළිබඳ අවසන් වාර්තා මේ වනවිට ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව මෙම කටයුතු කඩිනමින් සිදු කිරීම සඳහා නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් ප්‍රතිපත්ති ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	මේ වනවිට ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් ප්‍රතිපත්ති ප්‍රකාරව අදාළ නිරවුල් කිරීම් සිදු කර ඇත.
පොදු තැන්පතු ගිණුමේ කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන්, 571 වගන්තිය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	පොදු තැන්පතු ගිණුමේ තිබූ කල් ඉකුත්වූ තැන්පතු විශාල ප්‍රමාණයක් සම්බන්ධයෙන් 571 වගන්තිය ප්‍රකාරව කටයුතු කර ඇති අතර තව දුරටත් ශේෂයක් ලෙස පවතින්නේ ක්‍රියාත්මක ව්‍යපෘති වෙනුවෙන් සිදු කල රදවාගැනීම් පමණි.
371 වගන්තිය ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	වර්තමානය වනවිට මු.රෙ.371 ප්‍රකාරව කටයුතු කරමින් පවතින අතර මනා අධීක්ෂණයකින් යුතුව මෙම කාර්යය සිදු කිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත.
371 වගන්තියේ වන සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.	වර්තමානය වනවිට මු.රෙ.371 ප්‍රකාරව කටයුතු කරමින් පවතින අතර මනා අධීක්ෂණයකින් යුතුව මෙම කාර්යය සිදු කිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත.
දෙවැනි කොටස: 54.50	
2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍ර ලේඛනයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	වර්තමානය වනවිට රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර ඇත.
ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක	වර්තමානය වනවිට රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ

වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර ඇත.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	2023 වසර සඳහා අදාල කටයුතු ආරම්භ කර තිබූ අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 (1) මඟින් (2023.11.30) වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් තවදුරටත් අවශ්‍ය නොවන බව දන්වා ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ වයාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	නියමිත නීත රීති චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන ලෙස සියලුම නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති අතර එමඟින් හිතකර මතයක් ලබා ගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරමි.
2020.02.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 12.1 වගන්තියට අනුව, ආයතනයේ කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මැන බැලිය හැකි කාර්යසාධන දර්ශක තුනක් හඳුනාගෙන නොතිබුණි	2023 සහ 2024 වර්ෂයන් තුළ කාර්යසාධන දර්ශක තුනක් හඳුනාගෙන සඳහන් කර ඇත. එම කාර්යසාධන දර්ශකවල ප්‍රගතිය ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි	අදාල නිර්දේශ හැකි සෑම විටම ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. 2023 වසරේ දී විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන ලදි.
නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රේ.156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි	දී ඇති කාලරාමුව තුළ මෙම කටයුත්ත නිවැරදිව හා මනා අධීක්ෂණයකින් යුතුව සිදු කිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත.
උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි	අමාත්‍යාංශ නිලධාරීන්ගේ පත්වීම් බලධාරයා/ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වන බැවින් ස්ථාන මාරු ලබා දිය යුත්තේද රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසිනි. උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් ස්ථානමාරු කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත නිර්දේශ කර යවා ඇත. එසේ වුවද මේ වන තෙක් ස්ථාන මාරු ලබා දී නොමැත. නිසි පරිදි අනුප්‍රාප්තිකයන් සහිතව හැරෙන්නට නිලධාරීන් තනතුරුවලින් නිදහස් කිරීමට මේවන විට අමාත්‍යාංශයේ ඇතිව තිබෙන පුරප්පාඩු ප්‍රමාණය අනුව හැකියාවක් නොමැත.
නාගරික සංවර්ධන, නිවාස අමාත්‍යාංශය 1 කොටස 84.00 I. අවදානම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මෑතකදී මහා භාණ්ඩාගාරය විසින් අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් සංවිධානය කරන ලද

	වැඩමුළුවක් සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන ගණකාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් සහභාගී විය. ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ අයික්ෂණය යටතේ අවදානම් ලේඛනයක් පවත්වාගෙන යාමට ඉදිරියේදී පියවර ගනු ඇත.
II. විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් ලැබී මාසයක් ඇතුළත එම සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු යවා නොතිබුණි.	දැනට පිළිතුරු සැපයීමට කිසිදු විගණන විමසුමක් ඉතිරිව නොමැති අතර සියලුම විමසුම් සඳහා පිළිතුරු සපයා ඇත. තවද, ලබා දී ඇති කාලසීමාව තුළ වාර්තා කරන ලෙස අදාළ විෂය භාර නිලධාරීන්ට උපදෙස් දී ඇත.
III. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාස 1ක කාලසීමාවක් ඇතුළත පිළිතුරු සපයා නොමැති අවස්ථා පැවතුණි.	දැනට පිළිතුරු සපයා නොමැති කිසිදු විගණන විමසුමක් නොමැති අතර සියලුම විමසුම් සඳහා පිළිතුරු සපයා ඇත. පිළිතුරු සැපයීම තවදුරටත් කඩිනම් කිරීමට උපදෙස් දී ඇත.
IV. මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව, විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කර වර්ෂය ආරම්භයේදී අභ්‍යන්තර විගණන වැඩසටහන සකස් කර නොතිබුණි.	මීට පෙර මෙම අමාත්‍යාංශය නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති අංශයක් වූ අතර, වර්තමානය වන විට එය වෙනම අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිත කර ඇත. ඉදිරි කටයුතු මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව සිදු කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.
V. සියලුම වාහනවල අයිතිය තහවුරු කිරීම සඳහා වන ලේඛන සන්තකයේ නොතිබුණි. සියලුම සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය සලකුණු කර නොතිබුණි. ධාවනයෙන් ඉවත් කරන ලද වාහන, ඒවා ධාවනයෙන් ඉවත් කර මාස 8කට අඩු කාලසීමාවක් ඇතුළත විධිමත් ලෙස බැහැර කර නොතිබුණි. මුදල් රෙගුලාසි ප්‍රකාරව, රජය සතු මෝටර් වාහනවලට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. වසර 1 ඉක්ම වූ හිඟ ශේෂයන් පියවා නොතිබුණි.	වර්තමානය වන විට, අමාත්‍යාංශයේ වාහන සංචිතය යටතේ ධාවනය වන සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර අලවා ඇත. මේ වන විට නිසි වගවීම සහ පාලනය සහතික කිරීම සඳහා මුදල් රෙගුලාසි සහ අදාළ පරිපාලන ක්‍රියාපටිපාටිවලට දැඩි ලෙස අනුකූලව සියලුම වාහන අනතුරු සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ.
02 කොටස 78.00	
i. සැලසුම් කරන ලද පුහුණු අවස්ථාවන් අතුරින්, සැබවින්ම ලබා දී ඇති පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට වඩා අඩු විය.	පුහුණු සැලැස්මට අනුකූලව පුහුණු අවස්ථාවන් පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත.
ii. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, තත්ත්වාගණනය කළ මතයක් (qualified opinion) / ව්‍යාවනය කළ මතයක් (disclaimed opinion) / අහිතකර මතයක් (unfavorable opinion) වී තිබුණි.	සත්‍ය හා සාධාරණ මතයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස සැමවිටම උපදෙස් දී ඇත.
iii. විගණකාධිපති වාර්තාවේ සඳහන් නිර්දේශ	

ක්‍රියාත්මක කර නොතිබුණි.	හැකි සෑම අවස්ථාවකදීම අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.
iv. උපරිම සේවා කාලය සම්පූර්ණ කර සිටි නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණි. අමාත්‍යාංශ නිලධාරීන්ගේ පත්වීම් බලධාරයා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වන බැවින් ස්ථාන මාරු ලබා දිය යුත්තේද රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසිනි. උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් ස්ථානමාරු කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත නිර්දේශ කර යවා ඇත. එසේ වුවද මේ වන තෙක් ස්ථාන මාරු ලබා දී නොමැත. නිසි පරිදි අනුප්‍රාප්තිකයන් සහිතව හැරෙන්නට නිලධාරීන් තනතුරුවලින් නිදහස් කිරීමට මේවන විට අමාත්‍යාංශයේ ඇතිව තිබෙන පුරප්පාඩු ප්‍රමාණය අනුව හැකියාවක් නොමැත.
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව	
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2022.12.13 දිනැති අංක 05/2022 දරන මාර්ගෝපදේශවල 8.1 සහ 8.2 ඡේද ප්‍රකාරව, CIGAS වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය (Fixed Assets Module) යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	2025 වර්ෂයේ සිට CIGAS වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය සහ ස්ථාවර වත්කම් වාර්තා එකිනෙක සමඟ සැසඳීමට ලක් කර ඇති අතර, වර්තමානය වන විට CIGAS වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, අලාභ ලේඛනය (Register of Loss) යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	ඉතා පැරණි අලාභයන් අලාභ ලේඛනයේ සටහන් කරනු ලබන අතර, ඒවාට අදාළ තොරතුරු ඇතුළත් ලිපිගොනු සොයාගැනීමේ අපහසුතාවය හේතුවෙන් මෙම ප්‍රමාදය සිදු වී ඇත. මේ වන විට ඉන් 90% ක් පමණ යාවත්කාලීන කර ඇත. ඉතිරි වී ඇති අලාභයන් මෙම වසර අවසානයට පෙර යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ඇත.
රජයේ වැටුප් ලේඛන මෘදුකාංග පද්ධතියට (Government payroll software package) අදාළ පළමු මුරපදය ගණකාධිකාරීවරයා හෝ බලයලත් විධායක නිලධාරියෙකු විසින් පමණක් භාවිත කර නොතිබුණි.	දැනට, රජයේ වැටුප් ලේඛන මෘදුකාංග පද්ධතියට අදාළ පළමු මුරපදය ගණකාධිකාරීවරයා විසින් පමණක් භාවිත කරනු ලබයි.
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, මෘදුකාංග පද්ධතියේ පළමු, දෙවන සහ තෙවන මුරපද සෑම මාස තුනකට වරක්ම වෙනස් කර නොතිබුණි.	වර්තමානය වන විට, වැටුප් ලේඛන මෘදුකාංග පද්ධතියේ පළමු, දෙවන සහ තෙවන මුරපද සෑම මාස තුනකට වරක්ම වෙනස් කර පවත්වාගෙන යනු ලැබේ.
විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් ලැබී මාසයක් ඇතුළත එම සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු	නිලධාරීන් හිඟ වීම සහ ඔවුන් රාජකාරිමය වශයෙන් කාර්යබහුල වීම හේතුවෙන් විගණන විමසුම්වලට

යවා නොතිබුණි. එමෙන්ම, අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාස එකක කාලසීමාවක් ඇතුළත පිළිතුරු සපයා නොමැති අවස්ථා පැවතුණි.	පිළිතුරු සැපයීමේ ප්‍රමාදයක් පැවතුණ ද, ඉදිරියේදී විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් සහ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළත පිළිතුරු සැපයීමට පියවර ගෙන ඇත.
2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන ඡේදය ප්‍රකාරව, 2018 වර්ෂයට අදාළ වත්කම් මිලදී ගැනීම් සහ බැහැර කිරීම් පිළිබඳ තොරතුරු කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2026 වර්ෂයේ සිට වත්කම් මිලදී ගැනීම් සහ බැහැර කිරීම් පිළිබඳ තොරතුරු කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යැවීමට පියවර ගෙන ඇත.
භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල (Board of Surveys) මඟින් අනාවරණය කරන ලද අතිරික්තයන්, ඌනතාවයන් සහ අනෙකුත් නිර්දේශයන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මඟින් අනාවරණය කරන ලද අතිරික්තයන් සහ ඌනතාවයන් සඳහා හේතු, භාණ්ඩ භාරකරුවන්ගෙන් සහ ගබඩාකරුවන්ගෙන් විමසීමෙන් පසු එම හේතු පිළිගත හැකි මට්ටමක පවතී නම්, ඌනතාවයන් පොත්වලින් ඉවත් කිරීමටත් අතිරික්තයන් පොත්වලට ඇතුළත් කිරීමටත් ගණන් දීමේ නිලධාරියා පියවර ගෙන ඇත. ඉදිරිපත් කරන ලද හේතු සෑහීමකට පත් විය නොහැකි නම්, අදාළ වත්කමේ වටිනාකම වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමටත් ඔවුන්ට එරෙහිව පරීක්ෂණ පවත්වනු ලැබීමටත් කටයුතු කරනු ඇත.
ධාවනයෙන් ඉවත් කරන ලද (Condemned) වාහන, ඒවා ධාවනයෙන් ඉවත් කර මාස 8කට අඩු කාලසීමාවක් ඇතුළත විධිමත් ලෙස බැහැර කර නොතිබූ අතර, සියලුම වාහනවල ධාවන සටහන් පොත් (Log books) යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	ධාවනය කළ නොහැකි අබලන් තත්ත්වයේ පැවති සියලුම වාහන රඳවා තබා ගෙන (Impounded) ඇත.
මුදල් රෙගුලාසි ප්‍රකාරව, රජය සතු මෝටර් වාහනවලට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	වාර්තා වී ඇති සියලුම මෝටර් වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇත. මේ සම්බන්ධයෙන් පොලිස් වාර්තා ලබා ගැනීමේදී සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් නියමිත කාලසීමාව තුළ පියවර ගැනීමට අපහසු වී ඇත. ඉදිරියේදී මෙම තොරතුරු යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ඇත.
වසර 1 ඉක්ම වූ හිඟ ශේෂයන් පියවා නොතිබුණි. තවද, අක්‍රිය ගිණුම් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මු.රේ.571 ප්‍රකාරව වසර 2 ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් ඉදිරියේදී පියවර ගැනීමට සටහන් කරගෙන ඇත. ණය ශේෂ පියවීම සම්බන්ධයෙන්ද කටයුතු සිදු කරමින් පවතී.
මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කරන ලද තත්කාර්ය අතුරු අග්‍රිම, අදාළ කාර්යය නිම කර මාස 1ක් ඇතුළත පියවා නොතිබුණි.	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කරන ලද තත්කාර්ය අතුරු අග්‍රිම (Interim orders/Sub imprests) මාස 1ක කාලසීමාවක් ඇතුළත පියවා අවසන් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1 කොටස **75.00** රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2022.12.13 දිනැති අංක 05/2022 දරන මාර්ගෝපදේශවල 8.1 සහ 8.2 ඡේද ප්‍රකාරව, CIGAS වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය (Fixed Assets Module) යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ඉඩම් තක්සේරු කිරීම්වල විස්තර/අගයන් CIGAS පද්ධතියට ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කර ඇත. (මේ දක්වා ඉඩම් 45ක් අතුරින් ඉඩම් 24ක තක්සේරු කිරීම් අවසන් කර ඇත) – (ඇමුණුම – 01) මිලදී ගත් සහ බැහැර කරන ලද සියලුම ස්ථාවර වත්කම් අදාළ මොඩියුලයට ඇතුළත් කර යාවත්කාලීන කර ඇත; තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් විස්තර ලබා දුන් වහාම ඒවාට අදාළ ඉඩම් සහ ගොඩනැගිලි පද්ධතියට ඇතුළත් කර පවත්වාගෙන යනු ලැබේ.
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, මෘදුකාංග පද්ධතියේ පළමු, දෙවන සහ තෙවන මුරපද සෑම මාස තුනකට වරක්ම වෙනස් කර නොතිබුණි.	2025 වර්ෂයේ සිට සෑම මාස තුනකට වරක්ම මුරපදය වෙනස් කරමින් පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන ඡේදය ප්‍රකාරව, 2018 වර්ෂයට අදාළ වත්කම් මිලදී ගැනීම් සහ බැහැර කිරීම් පිළිබඳ තොරතුරු කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2018 වර්ෂයේ සිට වත්කම් අත්පත් කර ගැනීම් සහ බැහැර කිරීම් පිළිබඳ තොරතුරු වාර්තා කර තිබුණ ද, කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලයෙන් ලැබුණු වාචික උපදෙස් මත එය වසර කිහිපයක් යනතුරු ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, චක්‍රලේඛ මාර්ගෝපදේශයන්ට අනුකූලව එම තොරතුරු මේ වන විට නැවත ඉදිරිපත් කරමින් පවතී.
සියලුම සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය සලකුණු කර නොතිබුණි.	2024.12.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය අලවා ඇත.
සියලුම වාහනවල ධාවන සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	නියමිත ආකෘති පත්‍රවලට අනුව ධාවන සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.
අක්‍රිය ගිණුම් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මුදල් රෙගුලාසි 571 හි දක්වා ඇති පරිදි, කල්ඉකුත් වූ (Lapsed) තැන්පතු බහුතරයක් රජයේ ආදායමට හෝ අදාළ ආයතන වෙත පැවරීම මඟින් පියවා ඇති අතර, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතිවලට අදාළ තැන්පතු කිහිපයක් පමණක් තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ.
එකතු කරන ලද ආදායම්, අදාළ ප්‍රතිපාදනවලට අනුකූලව ප්‍රතිපූර්ණය කර නොතිබුණි.	එකතු කිරීමට ඇති රජයේ ආදායම් නිසි පරිදි සැසඳුම් කර රජයේ ආදායම් ගිණුමට බැර කර ඇත.
අනුමත සීමාවන් ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම/අනුයුක්ත කිරීම සිදු කර තිබුණි.	ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද 2021.03.26 දිනැති අංක

	CS/DOS/Policy/01/01(II) දරන ලිපිය ප්‍රකාරව සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීම සිදු කරන ලදී. (ඇමුණුම 02) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද 2024.09.10 දිනැති අංක DMS/1116/Vol-II දරන ලිපිය මඟින් අදාළ අතිරේක සංවර්ධන නිලධාරී තනතුරු සඳහා අනුමැතිය ලබා දී ඇත. (ඇමුණුම 03)
ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනතාවට පැමිණිලි ඉදිරිපත් කිරීමට හෝ ප්‍රශංසා ලබා දීමට අවස්ථාවක් සලසා දී නොමැත.	ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනතාවට පැමිණිලි හෝ ප්‍රශංසා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දී ඇත. ඉදිරිපත් කරනු ලබන පැමිණිලි විද්‍යුත් තැපෑල මාර්ගයෙන් ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දෙනු ලැබේ.
තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැනීම සඳහා වන දර්ශක සකස් කර නොතිබුණි.	තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැනීම සඳහා එක් දර්ශකයක් හඳුනාගෙන ඇත. එනම්, • අලුතින් ඉදිකරනු ලබන සියලුම රජයේ ගොඩනැගිලි සූර්ය බලශක්තිය භාවිතයෙන් පුනර්ජනනීය බලශක්තිය උත්පාදනය කරන පහසුකම්වලින් සමන්විත වන අතර එමඟින් ඔවුන්ගේ බලශක්ති අවශ්‍යතාවලින් 25% ක් සපුරා ගනු ලබයි.
සකස් කර තිබූ මානව සම්පත් සංවර්ධන සැලැස්ම මඟින්, කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් 50% කට වඩා වැඩි පිරිසක් සඳහා වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලැබෙන බව තහවුරු කර නොතිබුණි.	2025 වර්ෂයේදී කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් 50% කට වඩා වැඩි පිරිසකට පුහුණු අවස්ථා ලබා දීමට හැකි වුවද, 2023 සහ 2024 වර්ෂවලදී පිරිවැය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, බලාපොරොත්තු වූ පරිදි සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත පුහුණු අවස්ථා ලබා දීමට නොහැකි විය.
සැලසුම් කරන ලද පුහුණු අවස්ථාවන් අතුරින්, සැබවින්ම ලබා දී ඇති පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට වඩා අඩු විය.	සැලසුම් කරන ලද පුහුණු අවස්ථාවලට සාපේක්ෂව 2023, 2024 සහ 2025 වර්ෂවලදී ලබා දුන් පුහුණු අවස්ථා සංඛ්‍යාව පිළිවෙළින් 75%, 72.73%, 73.21% ආදී වශයෙන් වූ අතර, ඒ අනුව වසර 3 තුළදීම පුහුණු අවස්ථා ලබා දීම 50% ක සීමාව ඉක්මවා ගොස් ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, තත්ත්වාගණනය කළ මතයක් (qualified opinion) / ව්‍යාචනය කළ මතයක් (disclaimed opinion) / අහිතකර මතයක් (unfavorable opinion) වී තිබුණි.	සත්‍ය හා සාධාරණ මතයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස සැමවිටම උපදෙස් ලබා දී ඇත.
විගණකාධිපති වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවල දක්වා ඇති නිරීක්ෂණ සහ නිර්දේශයන්ට අනුකූලව අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට පියවර ගෙන ඇත.
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) විසින් නිකුත් කරන ලද උපදෙස්/නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) විසින් ලබා දුන් නිර්දේශවලින් බහුතරයක් ක්‍රියාත්මක කර ඇති අතර, ඉතිරි නිර්දේශ කිහිපය මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

උපරිම සේවා කාලය සම්පූර්ණ කර සිටි නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	උපරිම සේවා කාලය සම්පූර්ණ කර ඇති, දීප ව්‍යාප්ත සේවාවන්ට (ශ්‍රී ලංකා පරිපාලන සේවය සහ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය) සහ ඒකාබද්ධ සේවාවන්ට (කළමනාකරණ සේවා නිලධාරී සේවය, සංවර්ධන නිලධාරී සේවය, කාර්යාල සේවක සේවය, රියදුරු සේවය) අයත් නිලධාරීන්ගේ විස්තර රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති අතර, ස්ථාන මාරු නියෝග නිකුත් කිරීමේ බලය පවතින්නේ එම අමාත්‍යාංශය සතුවය. සේවා අවශ්‍යතාවය අනුව දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල මාරු කිරීම් සිදු කෙරේ. මීට අමතරව, පහත සඳහන් දිනවලදී අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටීන් සකස් කර අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇත: තාක්ෂණ නිලධාරීන් (දිනය – 2026.03.31), තාක්ෂණික සහකාර, කම්කරු (දිනය – 2026.02.03).

වෛද්‍ය එච්.එම්. සුසිල් රණසිංහ
අමාත්‍ය
නිවාස ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය

වෛද්‍ය සුසිල් රණසිංහ
ඇමැති නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය
2 වන මහල, "සෙත්සිරිපාය", (බළුවාපිටිය 1)
බත්තරමුල්ල.